# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2022 අංක 26 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 26 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 සැප්තැම්බර් මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 15.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 26 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 26 වන දින]

එල්.ඩී.—ඕ. 1/2020

**1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක 26 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1982 අංක 6 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) සංස්ථාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) නිල බලයෙන් පත්වන එක් සාමාජිකයකු, එනම්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයා විසින් නම් කරන ලද එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු;

(ආ) පහත දැක්වෙන ආකාරයෙන් නම් කරන ලද සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනෙකු:-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු, එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයකු;

(ii) අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු, එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයකු;

(iii) 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව පවරා ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ සංස්ථාවේ නියෝජිතයකු විය යුතු එක් සාමාජිකයකු;

(iv) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව පවරා ඇති අමාත්‍යවරයා විසින් නම් කරන ලද ඒ සංස්ථාවේ නියෝජිතයකු විය යුතු එක් සාමාජිකයකු; සහ

(ඇ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන රූපවාහිනී ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් ආකාරයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ නීතිමය හෝ මූල්‍ය කාරණා හෝ පරිපාලනය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳව හෝ ගුවන් විදුලි ප්‍රචාරණය හා සන්නිවේදනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි පුළුල් පළපුරුද්ද, හැකියාව හා පිළිගැනීමක් තිබේ යයි අමාත්‍යවරයාට පෙනී යන්නා වූ සාමාජිකයන් සිව් දෙනෙකු.";

(2) එහි (5) වන උපවගන්තියේ "සෑම සාමාජිකයකුම" යන වචන වෙනුවට "සෑම පත් කළ සාමාජිකයකුම" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (6) වන උපවගන්තියේ "යම් සාමාජිකයකු" යන වචන වෙනුවට "යම් පත් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (7) වන උපවගන්තියේ "යම් සාමාජිකයකුට" යන වචන වෙනුවට "යම් පත් කළ සාමාජිකයකුට" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (8) වන උපවගන්තියේ "යම් සාමාජිකයකු" යන වචන වෙනුවට "යම් පත් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එහි (9) වන උපවගන්තියේ "යම් සාමාජිකයකු" යන වචන වෙනුවට "යම් පත් කළ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ "නියෝජිතයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම

" "අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ රූපවාහිනී සංස්ථාව පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;".

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.